# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2192/64 - 2020 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2020.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් (2019 ජුනි මස 04 වැනි දින අංක 2126/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත පරිදි වූ), 1984 ජනවාරි මස 24 වැනි දින අංක 281/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා රුහුණ විශ්වවිද්‍යාලය පිහිටුවමින් ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ, I වන තීරයේ දැක්වෙන "කළමනාකරණ හා මූල්‍ය පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "4. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"5. ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය".

මහාචාර්ය ජී. එල්. පීරිස්,
අධ්‍යාපන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

09 - 684

1A - PG 5130 — 520 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*